# අහසින් ගිය ඉබ්බා



සෙතුලි
දිනුලිමා රණතුංග

# අහසින් ගිය ඉබ්බා

සෙතුලි දිනුලිමා රණතුංග

පළමු දිගහැරීම

මහාමායා බාලිකා විද්‍යාලය

2 වසර B

2026.04.08

978-624-211-246-6

# පිදුම

උපන්දා සිට මාගේ ජීවිතය

සාර්ථක කර ගැනීමට හා

මාගේ අධ්‍යාපන කටයුතු

වෙනුවෙන් මාව දිරිමත් කරන

මාගේ දෙමව්පියන්ටත්,

මේ පොත එළිදැක්වීම වෙනුවෙන්

පුරොගාමී වූ පංති භාර ගුරුතුමිය,

අනිකුත් ගුරු මෑණිවරුන් හා ගරු පියවරුන් වෙත

මම මෙම පොත පිළිගන්වමි...!!!

# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරන බාලික අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරන හේමමාලා උපහාර ගත්කරන ව්‍යාපෘතිය නම් කල හැකිය.

දශයකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ඨ ජයග්‍රහණයකි.

මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොට ගෙන පොත් ලියන්නට යොමු කරන ලදි.

එහි ප්‍රතිපලයක් ලෙස ලියවී ඇති ළමා ග්‍රන්ථ තුලින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කල ශ්‍රී දළඳා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුනයි.

මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන්, මග පෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10



එක්තරා කැලෑවක
ලස්සන විලක් තිබුණා.



ඒ විලේ ඉබ්බෙක් ජීවත් උනා.



විලේ මාළු කන්න
කොක්කු දෙන්නෙක්
පුරුදු වෙලා සිටියා.



ඒ කොක්කු දෙන්නා ඉබ්බ්බත් එක්ක යාලු උනා.




ටික කාලයක් යනකොට නියගයක් ඇවිත් විලේ වතුර හිඳුනා.



විලේ මාළු මැරුණා.



කොක්කු දෙන්නා වෙන
විලක් සොයාගෙන ගියා.



ඉබ්බා දුකින් සිටියා. දවසක් කොක්කු දෙන්නා ඉබ්බා බලන්න ආවා. වතුර තියෙන විලට එක්කගෙන යන්න කියල ඉබ්බා කොක්කු දෙන්නට කිව්වා.



ඊට පස්සෙ කොක්කු
දෙන්නා ඉබ්බා අලුත්
විලට ගෙන යාමට
සූදානම් උනා.



කෝටු කෑල්ලක් ගෙන එහි මැදින් ඉබ්බාට හපා ගන්න කිව්වා.

කොටුවේ දෙපැත්තෙන් කොක්කු දෙන්න හපාගෙන පියාඹන්න වුණා.



ඔහොම යනකොට සෙල්ලම් කරන ළමයි පිරිසක් උඩින් යන ඉබ්බා දැක්කා.

ළමයි ඉබ්බාට හිනා උනා.



ඉබ්බා ළමයින්ට බනින්න කට ඇරියා.

අය්යෝ........... ඉබ්බා ගලක් උඩට වැටුනා.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශය අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් දත් කතුවරුන් ඇයට දායද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කරවීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනගට ලෝකය පෙන්වා දෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොත පත ද සමව පරිහරණය කලයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන් කිසිවෙකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වි ඇති පොතපතින් දරුවන් දුරස් විම වලක්වා ගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“ හේමමාලා උපහාර ”** ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය දියත්වේ. පාසල් දරුවන් තුල ශාස්ත්‍රිය හික්මිම මෙන්ම සාරධර්ම

නිපුණතා ප්‍රවර්ධනයක් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටු කල හේමමාල කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුනයි.

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමව්පියන්, ආදී ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිළමේතුමන් ඇතුලි ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාරය වෙනුවෙන් ස්තුතිවන්ත වෙමු.

සෙනවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)

978-624-211-246-6